මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව
වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

2009

மனிதவள மேம்பாட்டு நிறுவனம்
கொழும்புப் பல்கலைக்கழகம், ஸ்ரீலங்கா
ஆண்டறிக்கை மற்றும் வருடாந்த கணக்குகள்

2009

INSTITITUE OF HUMAN RESOURCE ADVANCEMENT
UNIVERSITY OF COLOMBO, SRI LANKA
ANNUAL REPORT AND ANNUAL ACCOUNTS

2009

IHRA
UNIVERSITY OF COLOMBO

පටුන

		පිටු අංකය
1	2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව	01 - 13
2	2009 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය	14
3	2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම	15
4	විගණකාධිපති වාර්තාව	16 - 22
5	2009 වර්ෂයට අදාල විගණන වාර්තාව පිළිබඳ ආයතනයේ අදහස්	23 - 30

பொருளடக்கம்

		பக்கம்
1.	2009 ஆம் ஆண்டிற்கான ஆண்டறிக்கை	31 - 39
2.	2009 டிசெம்பர் 31ஆந் திகதியில் ஐந்தொகை	40
3.	2009 டிசெம்பர் 31ஆந் திகதியில் முடிவடைந்த ஆண்டிற்கான செலவினக் கணக்குகள்	41
4.	பொதுக் கணக்குப்பரிசோதகர் அறிக்கை	42 - 50
5.	2009 ம் ஆண்டுக்கான கணக்காய்வு சம்பந்தமான கருத்ததுக்கள்	51 - 63

Contents

		Page No.
1	Annual Report for the year 2009	64 - 74
2	Balance Sheet as at 31st December, 2009	75
3	Income and Expenditure Account for the year Ended 31st December, 2009	76
4	Auditor General's Report	77 - 84
5	Comments of the IHRA on the Auditor Genaral's Report on the Accounts of the IHRA	85 - 92

මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA-UOC)
කොළඹ විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව 2009

1. හැඳින්වීම

2006 අංක 01 දරන නියමාවලියෙන් සංශෝධනය කරනු ලැබූ 1979 අංක 11 දරන නියමාවලිය යටතේ මානව සම්පත් අභිවර්ධන ආයතනය පිහිටුවන ලදී. "දැනුම් ආර්ථිකය" මගින් ගෝලීය සහ කලාපීය වර්ධනයන්ට අනුව මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA) ඉහළ මට්ටමකට වර්ධනය වෙමින් පවතියි.

ආයතනය පිහිටුවනු ලැබූ පසුගිය කාලයේ දී "දැනුමැති සේවකයින්" යන යෙදුම උපයෝගී කරගනු නොලැබුවත් සේවා නියුක්ත "සේවා කණ්ඩායම්" සඳහා අධ්‍යාපනයක් ලබාදීමේ මූලික පරමාර්ථය නොවෙනස්ව පැවතිණ. එතෙකුදු වුවත් වර්තමාන දැනුමැති සේවකයා යන කාණ්ඩයට සාම්ප්‍රදායික සේවා කණ්ඩායම් මෙන්ම කළමනාකරණ කාණ්ඩය ද ඇතුළත් වන අතර, "දැනුමැති සේවකයන්" මානව සම්පත් සම්බන්ධයෙන් ඕනෑම කාණ්ඩයක් අභිවර්ධනය කිරීමට ආයතනයේ වර්තමාන ප්‍රතිපත්ති පිළියෙළ කර ඇත. නිවැරදි සංවර්ධන මාවත තුල රටට මග පෙන්වීම සහ උපාධි අපේක්ෂකයන් පමණක් නොව තීරණ ගන්නන් ඇතුළත් රටේ සේවක කණ්ඩායම්වලට අධ්‍යාපනය ලබාදීමේ ද අතිමහත් වගකීම මෙම විශ්වවිද්‍යාල සහ විශ්වවිද්‍යාල ආයතන සතු වන්නේ ය. ලෝකයෙහි ඉතා වේගයෙන් වෙනස් වන්නා වූ දැනුමෙන් වර්තමාන සේවා කණ්ඩායම් සහ තීරණ ගන්නන් යාවත්කාලීන නොකරනු ලබන්නේ නම් අපේක්ෂිත පරිදි රටට ඉදිරියට යාමට නොහැකි වන්නේ ය. සේවක අධ්‍යාපන ආයතනය (IWE) ලෙසින් ආරම්භ වූ අවස්ථාවේ දී මෙන්ම වර්තමාන මානව සම්පත් අභිවර්ධන ආයතනනයේ (IHRA) මූලික සංකල්පය වන්නේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පවත්නා තත්ත්වයන් රඳවා ගනිමින් සේවාවන්හි නියුක්ත වූවන්ට අධ්‍යාපනය ලබාදෙන අතර රටට සේවය කිරීමයි.

2. ආයතනයෙහි ඉදිරි දැක්ම සහ මෙහෙවර

ආයතනයෙහි නාමය වෙනස් කිරීමෙන් පසු 2006 වර්ෂයේ දී පහත සඳහන් ඉදිරි දැක්ම සහ මෙහෙවර පිළිගන්නා ලදී.

ඉදිරි-දැක්ම

අභියෝගාත්මක

ගෝලීය තත්වයනට

මුහුණ දියහැකි

සහ

අපගේ ජාතික සංවර්ධනයේ

මිනිස් පදනම ශක්තිමත් කළ හැකි වූ පරිණත සහ බුද්ධිමත්කම

සහිත

"දැනුම-භාවිතාකරන්නන්"

ලෙසින්

මානව සම්පත

අභිවර්ධනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම ඇපකැපවූ

ඉහළම තත්වයේ

පිළිගත් ආයතනයක්

බවට පත්වීමටය

මෙහෙවර

"උපයමින් ඉගෙනීම" කරන

සේව්‍යය, සේවක සහ ව්‍යවසායක වූ

සේවා-කාණ්ඩ සඳහා, තම හැකියාවන් ඉහළ නැංවීමට පූර්ණ තත්ව-කළමනාකරණ ක්‍රියාවලිය ඔස්සේ

ඉහල මට්ටමේ පරිපූර්ණ අධ්‍යාපනයක් ලබාගැනීමට පහසුකම් සපයමින් මග පෙන්වීම.

ඔවුන්ගේ විචාරාත්මකව සහ තර්කානුකූලව

සිතීමේ හැකියාව, ආචාරධර්ම, ප්‍රමිතීන්, ව්‍යවසාය දක්‍ෂතා, නායකත්ව ලක්‍ෂණ,

සහ

යුතුකම් හා අයිතිවාසිකම් එකිනෙක මත රඳාපවතින බව

අවබෝධකොටගෙන තිබීම ආදිය හොඳින් වර්ධනය කර ගැනීමට තවදුරටත් මග පෙන්වීම.

දේශයේ දැනුම්-ආර්ථිකය

සඳහා

බලපෑමක් ඇති කළ හැකි දායකත්වයක්

දැක්වීමට ඉහළ පෙළේ මිනිස් සම්පත් සමූහයක් ලෙස පෙළ ගැසුනු දැනුම්-සේවා-කාණ්ඩ උත්පාදනය කිරීමට කැපවීම.

3. 2009 වර්ෂයේ ආයතනික වර්ධනයන් සහ ලැබූ සංවර්ධනය පිළිබඳ සාරාංශය

3.1 රටේ වැඩ කරන මානව සම්පතට අතිරේක වටිනාකමක් එකතු කිරීම සහ සම්බන්ධීකරණය

ශ්‍රම අධ්‍යාපනවේදී සේවා නියුක්ත උපාධිධාරීන් 143 දෙනෙකු බිහි කිරීම, මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ සේවා නියුක්ත ඩිප්ලෝමාධාරීන් 19 දෙනෙකු බිහිකිරීම, ඉංග්‍රීසි භාෂා සහතිකපත් දරන්නන් 3000ක් සහ දෙමළ භාෂා සහතිකපත් දරන්නන් 266 දෙනෙකු බිහි කිරීම ද සිදුකරන ලදී.

3.2 ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන සඳහා ඉල්ලුම සැලකිය යුතු අන්දමින් වැඩිවීම

ඩිප්ලෝමාවට සහ උපාධි ප්‍රථම වර්ෂයේ වැඩසටහනට ඇතුළත් වීම සඳහා තරගකාරීත්වයක් ඇතිවිය. 2009 සැප්තැම්බර් මස අවසානයේ දී ආරම්භ වූ අධ්‍යාපන වර්ෂයේ දී විද්‍යාර්ථීහු 590 දෙනෙක් සිටියහ.

3.3 මානව සම්පත් අභිවර්ධන ආයතනයේ නව ඉදිකිරීම්

- නාන කාමරය සහ මුර කුටිය අලුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම, සෙසු විවිධ වැඩ ප්‍රධාන ගොඩනැගිල්ල පිළිසකර කිරීම
- විදුලි උපකරණ, විදුලිපංකා අලුතෙන් සවි කිරීම සහ පළමුවෙනි මහලෙහි සහ පරිගණක කාමරයෙහි විදුලි පේනු සවි කිරීම සහ විදුලි රැහැන් ඇදීම.
- දේශන ශාලාවේ පරිගණක සඳහා විදුලි පේනු සවි කිරීම සහ විදුලි රැහැන් ඇදීම.

3.4 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව අංක 4 දරන දෙමළ භාෂාව ඉගැන්වීමේ පාඨමාලාව ආරම්භ කිරීම.

3.5 ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ ඩිප්ලෝමා අංක 2 දරන පාඨමාලාව 2009 මැයි මස 02 දින ආරම්භ කිරීම.

සේවයෙහි නියුතු විද්‍යාර්ථීහු 29 දෙනෙක් මෙම පාඨමාලාව හදරති.

3.6 පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා භූ විද්‍යා තොරතුරු පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන ආයතනය විසින් පැවැත්වීම.

භූ විද්‍යා තොරතුරු පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ ස්ථාන 50 ක් සඳහා අයදුම්කරුවෝ 150 දෙනෙක් ඉල්ලුම් කළහ. 2009 මාර්තු මාසයේ දී මෙම පාඨමාලාව ආරම්භ කරන ලදී.

3.7 ආයතනය විසින් මානව සම්පත් අභිවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවෙනි කණ්ඩායම සඳහා වූ වැඩසටහන ආරම්භ කිරීම. **(PG Dip. HRA)**

මානව සම්පත් අභිවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වූ ස්ථාන 75 ක් සඳහා අයදුම්කරුවෝ 127 දෙනෙක් අයදුම්පත් ඉදිරිපත් කළ අතර පාඨමාලාව 2009 ජූනි මාසයේ දී ආරම්භ කරන ලදී.

4. කළමනාකරණය

2006 අංක 01 දරන නියමාවලියෙන් සංශෝධනය කරනු ලැබූ 1979 අංක 11 දරන නියමාවලිය මගින් ආයතනයේ වැඩකටයුතු පාලනය වන්නේ ය. මානව සම්පත් අභිවර්ධන ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ වන අතර එහි ශාස්ත්‍රීය කමිටුවේ (Acadamic Syndicate) නිර්දේශය මත පාලක සභාවේ අනුමැතිය අනුව උපකුලපති විසින් පූර්ණකාලීන අධ්‍යක්ෂවරයෙක් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂවරයා ආයතනයේ ගිණුම් නිලධාරියා වන අතර අධ්‍යයන සහ පරිපාලන නිලධාරියා ද වන්නේ ය. ශාස්ත්‍රීය කමිටුව ආයතනයේ අධ්‍යයන සේවා අධිකාරිය ද වන්නේ ය. නියමාවලියට අනුව පත්කරනු ලබන සෙසු සාමාජිකයින්ට අතිරේකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයින් අට දෙනෙකුගෙන් ශාස්ත්‍රීය කමිටුව සමන්විත වේ. ශාස්ත්‍රීය කමිටුවේ, විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ හා පාලක සභාවේ සහ කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ආයතනය විසින් අධ්‍යයන මණ්ඩල කිහිපයක් ස්ථාපිත කරනු ලැබ ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන ආයතනයට සපයනු ලබන අතර නියමාවලියට අනුව සියලු මූල්‍ය සහ පරිපාලන කටයුතු ආයතනය විසින් මෙහෙයවනු ලබයි. නියමාවලියට අනුව ආයතනයේ අධ්‍යක්ෂවරයා පරිපාලන සහ මූල්‍ය නිලධාරියා වන අතර සියලුම අධ්‍යයන කාර්යයන්ගේ වගකීම මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව වෙත සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාථන සභාව, පාලක සභාව මත රඳා පවතී. ආයතනය තුළ සංයුක්ත පාලන භාවිතයන් සහ සංයුක්ත පාලන සංස්කෘතියක් ක්‍රමානුකූලව හඳුන්වා දෙනු ලැබ ඇත.

4.1 ශාස්ත්‍රීය කමිටුව සහ අධ්‍යයන මණ්ඩල

4.1.1 ශාස්ත්‍රීය කමිටුව (2009 දෙසැම්බර් මාසය දක්වා)

විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ මාසික රැස්වීම් දහයක් (10 ක්) පවත්වනු ලැබීය. ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයන් පහත පරිදි වේ.

සභාපති - අධ්‍යක්ෂ : මානව සම්පත් අභිවර්ධන ආයතනය
ආචාර්ය ඩබ්ලිව්. කේ. හිරිඹුරේගම (2005 දෙසැම්බර් මස සිට)

නිල බලයෙන් පත් වූ සාමාජිකයෝ

පීඨාධිපති - ශාස්ත්‍ර පීඨය : මහාචාර්ය අමල් ජයවර්ධන
පීඨාධිපති - අධ්‍යාපන පීඨය : මහාචාර්ය එස්. සන්දරසේගරම්
පීඨාධිපති - විද්‍යා පීඨය : මහාචාර්ය ටී. ආර්. ආරියරත්න

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයෝ

මහාචාර්ය ඒ. එච්. එම්. හුසේන් - හිටපු විශ්ව විද්‍යාල ආචාර්යවරයෙකි
මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක - පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය
ඒ. පී. ගුණරත්න මහතා - හිටපු විදුහල්පති, ආනන්ද විද්‍යාලය, කොළඹ
එච්. එම්. එන්. වරකාඋල්ල මහතා, හිටපු ලේඛකාධිකාරී, කොළඹ විශ්වවිද්‍යාලය
එම්. ජී. ජී. හේමකුමාර මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව සම්පත් අභිවර්ධන ආයතනය
පාලිත හේමචන්ද්‍ර මහතා - අතිරේක සොලිසිටර් ජෙනරාල්
මහින්ද මඩිහහේවා මහතා - ලේකම්, කම්කරු අමාත්‍යාංශය
කේ. ගමගේ මහතා - විධායක අධ්‍යක්ෂ, ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය

අධ්‍යයන මණ්ඩල නියෝජනය කරන සාමාජිකයෝ

ආචාර්ය එච්. එස්. සී. ජයරත්න මහතා - මානව සම්පත් අධ්‍යයන මණ්ඩලය
ආර්. එම්. ආර්. බී. රාජපක්ෂ මහතා - මානව සම්පත් අධ්‍යයන මණ්ඩලය
ආචාර්ය බී. එම්. කිරිබණ්ඩා - භාෂා ඉගෙනුම් වැඩසටහන් මණ්ඩලය
ආචාර්ය බී. කේ. පී. අබේසූරිය මහතා - භාෂා ඉගෙනුම් වැඩසටහන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
ඩබ්ලිව්. එන්. විල්සන් මහතා - ව්‍යාපෘති වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය
ආචාර්ය ඩබ්ලිව්. එන්. කේ. විජේතුංග මහතා - ව්‍යාපෘති වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය

4.1.2 අධ්‍යයන මණ්ඩල

පහත දැක්වෙන පරිදි (සාමාන්‍යයෙන් මසකට වරක්) විමර්ශනයට භාජනය වන කාලය තුළ රැස්වීම් වාර පවත්වනු ලැබ ඇත.

(අ) මානව සම්පත් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය - රැස්වීම් වාර 12 යි

(ආ) භාෂා ඉගැන්වීම් වැඩසටහන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය - රැස්වීම් වාර 10 යි

(ඇ) ව්‍යාප්ති වැඩසටහන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය - රැස්වීම් වාර 10 යි

4.2 අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය

තනතුර	සාමාජිකයෝ	තනතුරේ ස්වභාවය
01. අධ්‍යක්ෂ	01	අධ්‍යයන සහ පරිපාලන
02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්	01	අධ්‍යයන
03. පරිවාස කාල කථිකාචාර්යවරුන්	02	අධ්‍යයන
04. අධ්‍යයන සමායෝජක	01	අධ්‍යයන
05. පාඨමාලා සමායෝජක	04	අධ්‍යයන
06. උපදේශන පරිගණක කාර්ය මණ්ඩලය	01	තාවකාලික
07. නියෝජ්‍ය මූල්‍ය අධිකාරී	01	පරිපාලන
08. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	01	පරිපාලන
09. සහකාර ලේඛකාධිකාරී/විභාග	01	පරිපාලන
10. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහකාරවරුන් (ලිපිකරු)	03	කාර්යාල සහාය
11. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහකාරවරුන් (ලඝු ලේඛක)	03	- එම -
12. කාර්ය මණ්ඩල සහකාරවරුන්	02	- එම -
13. ලිපිකරු (I වෙනි ශ්‍රේණිය)	01	- එම -
14. ලිපිකරු (II වෙනි ශ්‍රේණිය)	02	- එම -
15. පරිගණක යෙදවුම් සහකාර	03	- එම -
16. පොත් තබන්නා	01	- එම -
17. රියදුරු	02	- එම -
18. කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු	01	- එම -
19. බයිසිකල් පණිවිඩකරු	01	- එම -
20. කම්කරු	05	- එම -
පුස්තකාල සේවා		
21. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපතිවරු	01	අධ්‍යයන සහ පරිපාලන
22. පුස්තකාල සහායක	01	සහාය
23. පුස්තකාල සේවක	01	සහාය
24. කම්කරු	01	සහාය

4.2.2 ආයතනයේ මානව සම්පත් අභිවර්ධන කටයුතුවල සාරාංශය

	දිනය/මාසය	සම්මන්ත්‍රණය/ වැඩමුළුව පුහුණු වැඩසටහන	සහභාගී වූ අයගේ නම	ගෙවූ මුදල	සැපයුම්කරු
01	2009 ජනවාරි 27 සහ 28 දිනයන්හි	ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය - එක්සත් රාජධානිය	කේ පී මාතොට -ආරච්චි මිය	රු 220031/-	සැල්ෆෝර්ඩ් විශ්වවිද්‍යාලය - එක්සත් රාජධානිය
02	2009 02 18	යහ පාලනය පිළිබඳ සම්මන්ත්‍රණය	ආචාර්ය ඩබ්ලිව් කේ හිරිඹුරේගම මයා එම් ජී පී මැණිකේ මිය	රු 3360/-	වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය
03	2009 වර්ෂය ඇතුළත	උසස් ඉංග්‍රීසි භාෂාව - ඉංග්‍රීසි භාෂා අධ්‍යනාංශය	ඒ එස් ජයරත්න මහත්මිය	රු 12100/-	ඉංග්‍රීසි භාෂා අධ්‍යනාංශය -කොළඹ විශ්වවිද්‍යාලය
04	2009 06 25	පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ සම්මන්ත්‍රණය	ආර් එම් එස් එම් රත්නායක මිය	රු 7500/-	ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
05	අගොස්තු මාසය තුළ	පුස්තකාල සේවකයින් සඳහා වූ පුහුණු වැඩසටහන	එම් බී එම් යූ සමරසේකර මහතා	රු 5000/-	ජාතික පුස්තකාල විඥාපන විද්‍යා පිළිබඳ ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය
06	සැප්තැම්බර් මාසය තුළ	රාජ්‍ය සම්පාදන පරිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන	ඩී එම් එස් එන් කේ බණ්ඩාර මයා	රු 5000/-	රාජ්‍ය ගිණුම් සහ මූල්‍ය ආයතනය
07	ඔක්තෝබර් මාසය තුළ	පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - iii පියවර	පී වයි අයි රාජපක්ෂ මිය	රු 12000/-	ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

5. අධ්‍යයන වැඩසටහන් සහ විද්‍යාර්ථීන් සංඛ්‍යාව

මානව සම්පත් අභිවර්ධන ආයතනය සේවා නියුක්ති විද්‍යාර්ථීන් දනුමැති සේවකයින් වශයෙන් අභිවර්ධනය කිරීම සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් යටතේ කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් මෙහෙයවනු ලබයි. මෙහි විවිධ ක්ෂේත්‍ර වන්නේ -

(අ) උපාධි පාඨමාලාව (ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය)

(ආ) උපාධි පූර්ව ඩිප්ලෝමා වැඩසටහන් (ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා වැඩසටහන සහ අනෙකුත් ඩිප්ලෝමා පාඨමාලාවන්) (උපයා ගත් මූල්‍ය ප්‍රතිපාදන භාවිතයෙනි)

(ඇ) පශ්චාත් උපාධි වැඩසටහන් (උපයා ගත් මූල්‍ය ප්‍රතිපාදන භාවිතයෙනි)

(ඈ) සහතිකපත්‍ර පාඨමාලා සහ කෙටි කාලීන වැඩමුළු සහ වෙනත් වැඩසටහන් (උපයා ගත් මූල්‍ය ප්‍රතිපාදන භාවිතයෙනි)

5.1 මූලික උපාධි පාඨමාලාව - ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය

මෙම වැඩසටහන අංශ දෙකකින් සමන්විත වන අතර මෙය අභ්‍යන්තර උපාධි අධ්‍යාපන වැඩසටහනක් ද වන්නේ ය. මෙම ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය කොළඹ විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තුන් අවුරුදු උපාධියකි. උපාධි පළමුවෙනි වසරට ඇතුළත් වීමට සුදුසුකම් නොමැති අයවලුන් එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවට සහ අදල පරීක්ෂණ සම්පූර්ණ කළ පසු උපාධි පළමු වසර සඳහා බඳවා ගනු ලැබේ. පාඨමාලාව සම්පූර්ණ කළ සේවා නියුක්ත 140 දෙනෙකුට 2010 වර්ෂයේ උපාධි ප්‍රදනෝත්සවයේ දී ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය පිරිනමනු ලැබීය. මෙම අධ්‍යයන වැඩසටහනේ විවිධ මට්ටම් සඳහා 2009 වර්ෂයේ ලියාපදිංචිව සිටි මුළු සංඛ්‍යාව 590 කි. එහි විස්තර පහත දක්වා ඇත.

ශ්‍රම අධ්‍යාපනවේදී වැඩසටහනෙහි සිටි විද්‍යාර්ථීන් සංඛ්‍යාව

<table>
<tr><th>අධ්‍යයන වැඩසටහන්වල මට්ටම්</th><th colspan="2">සමස්ත විද්‍යාර්ථීන් සංඛ්‍යාව</th><th colspan="2">2008 වර්ෂය සඳහා අලුතින් ලියාපදිංචි වූ සංඛ්‍යාව</th><th colspan="2">අලුතින් ලියාපදිංචි වූ සංඛ්‍යාව</th></tr>
<tr><td>ඩිප්ලෝමා මට්ටම</td><td>184</td><td>184</td><td>96</td><td>96</td><td>59</td><td>59</td></tr>
<tr><td>ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි I වෙනි කොටස (සිංහල මාධ්‍යය)</td><td>268</td><td rowspan="2">268</td><td>177</td><td rowspan="2">177</td><td>189</td><td rowspan="2">189</td></tr>
<tr><td>ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි I වෙනි කොටස (ඉංග්‍රීසි මාධ්‍යය)</td><td>0</td><td>0</td><td>0</td></tr>
<tr><td>ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි II වෙනි කොටස (සිංහල මාධ්‍යය)</td><td>210</td><td rowspan="2">230</td><td>217</td><td rowspan="2">217</td><td>146</td><td rowspan="2">146</td></tr>
<tr><td>ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි II වෙනි කොටස (ඉංග්‍රීසි මාධ්‍යය)</td><td>20</td><td>0</td><td>0</td></tr>
<tr><td>ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි III වෙනි කොටස (සිංහල මාධ්‍යය)</td><td>136</td><td rowspan="2">154</td><td>190</td><td rowspan="2">208</td><td>196</td><td rowspan="2">196</td></tr>
<tr><td>ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි III වෙනි කොටස (ඉංග්‍රීසි මාධ්‍යය)</td><td>18</td><td>18</td><td>0</td></tr>
<tr><td>මුළු සංඛ්‍යාව</td><td colspan="2">836</td><td colspan="2">698</td><td colspan="2">590</td></tr>
</table>

2009 අධ්‍යාපන වර්ෂයේ ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලාව සහ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි I වෙනි කොටස සඳහා විද්‍යාර්ථීන් තෝරා ගැනීම පිණිස 2009 මැයි මස 17 වන දින තෝරා ගැනීමේ පරීක්ෂණයෙන් සාර්ථකව සමත් වූ අයවලුන් සඳහා සම්මුඛ පරීක්ෂණය පවත්වන ලදී. මේ අනුව පිළිවෙළින් විද්‍යාර්ථීන් 50 දෙනෙක් සහ 111 දෙනෙක් ඍජුවම ඩිප්ලෝමා පාඨමාලාව සහ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා තෝරාගනු ලැබිණ. මීට අතිරේකව ඩිප්ලෝමා මට්ටමේ සිට ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි (I වෙනි කොටස) පාඨමාලාව සඳහා විද්‍යාර්ථීන් 78 දෙනෙකු තෝරා ගන්නා ලදී. මෙම මට්ටම් දෙකම සඳහා වූ මුළු අයදුම්කරුවෝ සංඛ්‍යාව 189 ක් වූහ.

ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා මට්ටමේ හා ශ්‍රම අධ්‍යාපන උපාධි I, II සහ III මට්ටම් සඳහා 2008 වසරේ විභාග පවත්වා සමත්වූවන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රතිඵල දෙවෙනි **සෙමෙස්තරය**

සමත් වූ සංඛ්‍යාව	69 යි
ඌණ සාමාර්ථය	28 යි

පළමුවෙනි කොටසෙහි ප්‍රතිඵල

(1 වෙනි **සෙමෙස්තරය**)

සමත් වූ සංඛ්‍යාව	132 යි
ඌණ සාමාර්ථය	33 යි

II කොටසෙහි ප්‍රතිඵල (පළවන **සෙමෙස්තරය**)

සමත් වූ සංඛ්‍යාව	166 යි
ඌණ සාමාර්ථය	25 යි

ශ්‍රම අධ්‍යාපනවේදී (නැවත පෙනී සිටීම)

පැරණි විෂය නිර්දේශය

සමත් වූ සංඛ්‍යාව	26 යි
ඌණ සාමාර්ථය	29 යි

ශ්‍රම අධ්‍යාපනවේදී (නැවත පෙනී සිටි)

පැරණි විෂය නිර්දේශය

සමත් වූ සංඛ්‍යාව	22 යි
නැවත පෙනී සිටි	08 යි

ශ්‍රම අධ්‍යාපනවේදී II වෙනි කොටස

(දෙවන **සෙමෙස්තරය**)

සමත් වූ සංඛ්‍යාව	155 යි
ඌණ සාමාර්ථය	39 යි

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මෙම උපාධි අපේක්ෂකයින් සේවා නියුක්තික විද්‍යාර්ථීන්ගේන් සමන්විත සුවිශේෂ කණ්ඩායමකි. ඔවුහු සේවයෙහි නියුක්තව සිටියදී ලබන දැනුම වෘත්තීය අභිවර්ධනය පිණිස රජය මුල්‍යාධාර ලබාදීමෙන් සහාය වන අතර විශ්වවිද්‍යාලයේ ලබන දනුම ස්වකීය කාර්යයන්හි දී යොදවා ගනු ලබති. දිනපතා සවස 5 සිට දිනකට පැය 2½ ක කාලයක් ඔවුහු විශ්වවිද්‍යාල පහසුකම් උපයෝගී කරගනු ලැබුව ද කොළඹ විශ්වවිද්‍යාලය අධි ආරක්ෂිත කලාපයේ පිහිටීම නිසා අතිශය දැඩි සීමාවන් යටතේ දේශනවලට සහභාගීවීමට සිදු වී ඇත.

වර්තමානයේ දී ආයතනයේ ස්ථිර කථිකාචාර්යවරු තිදෙනෙක් පමණක් සේවයේ යෙදී සිටිති. මීට අමතරව බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ආයතනය විසින් ලබාගනී. කොන්ත්‍රාත් පදනම මත ආයතනයේ සේවය කරන අධ්‍යයන සම්බන්ධීකාරක විසින් උපාධි වැඩසටහනට අදාල සියලු වැඩකටයුතු සම්බන්ධීකරණය කෙරේ.

ශ්‍රම අධ්‍යාපනවේදී වැඩසටහනෙහි ප්‍රකටව පෙනෙන කරුණ නම් රාජ්‍ය සේවයේ දනටමත් සේවයේ නියුතු උපාධි අපේක්ෂකයින් පාඨමාලාවෙන් ලබා ගන්නා දනුම සෘජුවම තම කාර්යයන්හි දී භාවිත කිරීමයි.

5.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා

භූ තොරතුරු පද්ධති පශ්චාත් උපාධි පාඨමාලව ආයතනය විසින් 2009 වර්ෂයේ මාර්තු මාසයේ දී ආරම්භ කරන ලදී. සති අන්තයෙහි පැවැත්වෙන මෙම පාඨමාලාවට විද්‍යාර්ථීන් 150 දෙනෙකුගෙන් අයදුම්පත් ලද අතර තෝරා ගැනීමේ පරීක්ෂණයට 100 දෙනෙකු පෙනී සිටියහ. මේ අනුව සති අන්තයේ පවත්වන මෙම වැඩසටහන සඳහා 50 දෙනෙකු තෝරා ගන්නා ලදී.

මානව සම්පත් අභිවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (PGDipHRA) 2009 මාර්තු මාසයේ දී ආයතනය විසින් ආරම්භ කරන ලදී. විද්‍යාර්ථීන් 127 දෙනෙකු මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් ඉදිරිපත් කරන ලද අතර සති අන්ත වැඩසටහන් සඳහා විද්‍යාර්ථීන් 75 දෙනෙක් ලියාපදිංචි වූහ. මීට අදල පළමුවෙනි සෙමෙස්තරය සඳහා වූ දේශන 2009 දෙසැම්බර් මාසයේ දී අවසන් විය.

5.3 ඩිප්ලෝමා පාඨමාලා

රටේ වර්තමාන අවශ්‍යතාවය සඳහා ආයතනය විසින් පහත දක්වෙන අභ්‍යන්තර ඩිප්ලෝමා පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. මේ සඳහා පාඨමාලා ගාස්තු විද්‍යාර්ථීන් විසින් ගෙවනු ලබයි.

එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලා

(අ) මත්ද්‍රව්‍ය දූර්භාවිත කළමනාකරණ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව (DDAMS)

(ආ) රියදුරු සහ මාර්ග ආරක්ෂණ උපදේශන පුහුණු වැඩසටහන (DRSIT)

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DRDS)

(ඈ) ජාත්‍යන්තර ව්‍යාපාර ඩිප්ලෝමා පාඨමාලාව (DIB)

ඩිප්ලෝමා පාඨමාලාවට සහභාගී වූ විද්‍යාර්ථීන් සංඛ්‍යාව

	DDAMS	DRSIT	DIB
වර්ෂය	2009	2009	2009
ලියාපදිංචි වූ සංඛ්‍යාව	56	3	29

ජාත්‍යන්තර සංනිවේදන මාධ්‍යය ඉංග්‍රීසි භාෂාව වන බැවින් ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳව දෙවෙනි පාඨමාලාව ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් පවත්වන ලදී. ඒකීය සහ සම්මත ප්‍රමිතියක් ඇතිවන පරිදි මානව සම්පත් අභිවර්ධන ආයතනය මඟින් පැවැත්වෙන සියලුම එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලා සඳහා සමාන අතුරු නීති සංවර්ධනය කිරීමට 2006 වර්ෂයේ දී කටයුතු ආරම්භ කරන ලදී.

5.4 සහතිකපත් පාඨමාලා

5.4.1 ඉංග්‍රීසි භාෂා වැඩසටහන

අංක 28 වෙනි පාඨමාලාව 2009 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී. එහි උසස්, මූලික සහ අන්තර්මධ්‍යම මට්ටම්වල අවසන් පරීක්ෂණ 2009 අප්‍රේල් මස 26 වෙනි, මැයි මස 02 වෙනි සහ 03 වෙනි දිනයන්හි පැවැත්විණ. 2009. 03. 29 වන දින පවත්වන ලද ඉංග්‍රීසි භාෂා සහතිපත්‍ර පාඨමාලාව සඳහා පවත්වන ලද පරීක්ෂණයේ දී ඉංග්‍රීසි භාෂා දැනුම දක්ෂතාවය අනුව විද්‍යාර්ථීහු මට්ටම් 3 කට වර්ගීකරණය කරනු ලැබූහ. පාඨමාලාව පිළිබඳ අදල තොරතුරු පහත දැක්වෙන වගුවෙහි සටහන් වන්නේ ය.

2005 වර්ෂයේ සිට පැවැති සියලු ඉංග්‍රීසි පාඨමාලා සඳහා සහභාගී වූ සමස්ත විද්‍යාර්ථීන්ගේ සංඛ්‍යාව

වර්ෂය	2005	2006	2007	2008	2009
ලියාපදිංචි වූ සංඛ්‍යාව- සිසුන් සඳහා වූ පාඨමාලාව+ ගුරුවරුන් සඳහා වූ පාඨමාලාව	3716	4486	2679	6230	3439
සහතිකපත් ලැබූ සංඛ්‍යාව	2298	3550	2511	2493	1961

2009 වර්ෂයට අදාල ඉංග්‍රීසි භාෂා වැඩසටහනේ තොරතුරු

විද්‍යාර්ථීන් සඳහා පැවැති අංක 29 දරන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව 2009 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී. එහි විස්තර පහත සඳහන් වන්නේ ය.

2009 වර්ෂයේ දී ඉංග්‍රීසි භාෂා පාඨමාලාවට සහභාගී වූ විද්‍යාර්ථීන්ගේ සංඛ්‍යාව

	උසස් මට්ටම	අන්තර් මධ්‍යම මට්ටම	මූලික මට්ටම
ලියාපදිංචි වූ සංඛ්‍යාව	664	1196	619
විශිෂ්ඨ සාමර්ථ	57	50	14
සම්මාන සාමර්ථ	204	328	130
සාමාන්‍ය සාමර්ථ	268	548	313
සමත් වූ මුළු සංඛ්‍යාව	529	926	457

	උසස් මට්ටම	අන්තර් මධ්‍යම මට්ටම	මූලික මට්ටම
ලියාපදිංචි වූ සංඛ්‍යාව	922	1068	1260

ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි පාඨමාලා දෙකක් සම්පූර්ණ කරන ලද අතර ඒවායේ විස්තර පහත සඳහන් වන්නේ ය.

2009 වර්ෂයේ දී ගුරුවරුන් සඳහා පැවැති සහතිකපත් විභාගයට සහභාගී වූ විද්‍යාර්ථීන් සංඛ්‍යාව

	III වෙනි කොටස	II වෙනි කොටස	I වෙනි කොටස
ලියාලදිංචි වූ සංඛ්‍යාව	88	39	-
විශිෂ්ඨ සාමාර්ථය	13	-	
සම්මාන සාමාර්ථය	21	09	
සාමාන්‍ය සාමාර්ථය	25	19	
සමත් වූ මුළු සංඛ්‍යාව	59	28	

	III වෙනි කොටස	II වෙනි කොටස	I වෙනි කොටස
පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සංඛ්‍යාව	72	85	32

ඉංග්‍රීසි භාෂා පාඨමාලා ශාස්ත්‍ර පීඨයට අයත් පරිශ්‍රයේ දී පවත්වන ලද අතර ඒ සඳහා පංති කාමර සහ දේශන ශාලා මෙන්ම සේවකයින්ට ද සාධාරණ මුදලක් ගෙවනු ලැබීය. සියලු ආචාර්යවරුන් බාහිර උපදේශකයන් ලෙස පත් කළ අතර ආචාර්ය බී. එම්. කිරිබණ්ඩා පාඨමාලා සම්බන්ධීකරණය පිණිස පත්කරන ලදී.

5.4.2 දෙමළ භාෂා වැඩසටහන

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව රජයේ නිලධාරින්ට සහ පාසල් හැරයන යෞවන යෞවනියන් සඳහා 2007 වර්ෂයේ දී නව වැඩසටහනක් ආරම්භ කරන ලදී. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ජාතික විභාග සඳහා විද්‍යාර්ථීන් සූදනම් කිරීම පිණිස සිංහල භාෂාව කතා කරන විද්‍යාර්ථීන් අරමුණු කොට ගෙන පොදු විෂය නිර්දේශයකට අනුව මෙම විභාගය සැලසුම් කරනු ලැබීය. මෙහි මූලික මට්ටම දෙමළ භාෂා කථනය පිණිස වන අතර එය ජාතික විභාගය

අතින් ගත් කල තුන්වෙනි මට්ටම වන්නේ ය. අඩු ගාස්තු අය කිරීම සහ ඉහළ සම්මතයක් පවත්වාගෙන යාම ජාතික සේවය අතින් සලකන කල ඉතාමත් වැදගත් බව සඳහන් කළ යුතු ය. ග්‍රාමීය විද්‍යාර්ථීන්ට ද මෙම පාඨමාලාවට අයදුම් කිරීමට අවස්ථාව උද වී ඇත.

දෙමළ භාෂා මූලික පාඨමාලාව අංක 2 2009 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී. එහි අවසාන විභාගය 2009 පෙබරවාරි මස පළමුවෙනි දින පවත්වනු ලැබිය. මෙම පාඨමාලා පිළිබඳ අදල තොරතුරු පහත සඳහන් වගුවෙන් දක්වේ.

ලියාපදිංචි විද්‍යාර්ථීන් සංඛ්‍යාව	278
සහභාගී වූ බාහිර දේශකවරුන්ගේ සංඛ්‍යාව	08

දෙමළ භාෂා මූලික පාඨමාලාවට අදල සංඛ්‍යාලේඛන අංක 02

	අන්තර් මධ්‍යම	මූලික මට්ටම
විභාග සඳහා ලියාපදිංචි වූ සංඛ්‍යාව	37	193
විශිෂ්ඨ සාමර්ථය	16	77
සම්මාන සාමර්ථය	09	61
සාමාන්‍ය සාමර්ථය	06	28
සමත් වූ මුළු සංඛ්‍යාව	32	166

දෙමළ භාෂාව සහතිකපත්‍ර පාඨමාලාව අංක 04 2009 මාර්තු මස 07 වෙනි දින ආරම්භ විය.

ලියාපදිංචි වූ විද්‍යාර්ථීන් සංඛ්‍යාව	
මූලික මට්ටම	257
අන්තර් මධ්‍යම මට්ටම	101
උසස් මට්ටම	17
සහභාගී වූ බාහිර දේශකවරුන්ගේ සංඛ්‍යාව	10

6. පුස්තකාලය

මානව සම්පත් අභිවර්ධන ආයතනයෙහි පුස්තකාල පොත් 21,970 ක් පමණ ඇත. එය 2002 වර්ෂයේ සිට අධ්‍යාපන පීඨයේ තාවකාලික ගොඩනැගිල්ලක පිහිටුවනු ලැබ තිබේ. හතර දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් පුස්තකාලය සමන්විත ය. ශ්‍රම අධ්‍යාපනය පිළිබඳ ඉතා දුර්ලභ පොත්වලින් යුතු මෙම වටිනා සම්පත විශ්ව විද්‍යාලයීය ප්‍රජාවගේ උපයෝගීකරණය සඳහා ඉතා ඉක්මනින්ම ප්‍රතිසංවිධානය කළ යුතුව තිබේ.

7. මූල්‍ය ක්‍රියාකාරකම්

2009 වර්ෂය සඳහා සමස්ත රාජ්‍ය ප්‍රතිපාදනය රුපියල් මිලියන 16.8 ක් පමණ විය. ආයතනය විසින් උපයන ලද ආදායම රුපියල් මිලියන 39.4 කි.

2009 වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ ප්‍රධාන කරුණු

ආදායම X රු 1000/-			වියදම X රු 1000/-		
01	රාජ්‍ය ප්‍රතිපාදන - පුනරාවර්තන	16806	01	වේතන - අධ්‍යයන	4200
02	රාජ්‍ය ප්‍රතිපාදන - ප්‍රාග්ධන	1500	02	වේතන - අනධ්‍යයන	11539
03	රාජ්‍ය පරිගණක ශිල්පීය ප්‍රතිපාදන		03	බාහිර කථිකාචාර්යවරුන්	346
04	ව්‍යාප්ති පාඨමාලා ආදායම	34886	04	ගිවිසුම් සේවා	1993
05	වෙනත් ආදායම (පුනරාවර්තන වියදම් සඳහා)	4606	05	නඩත්තු වියදම්	856
06	වෙනත් ආදායම් (ප්‍රාග්ධන වියදම් සඳහා)		06	මිලට ගැනීම් - ප්‍රාග්ධන	1772
07			07	ව්‍යාප්ත පාඨමාලා සඳහා වූ වියපැහැදම්	29826
08			08	වෙනත් වියදම් උපාධි ප්‍රධානෝත්සවය ආදිය සඳහා	1248
					වෙනත්
01	සමස්ත ශුද්ධ ප්‍රාග්ධන වත්කම්	55243	01	අයිතිවාසිකම් සහ වගකීම්	66951
	වර්තමාන වත්කම්	11708			
මුළු සංඛ්‍යාව		66951	මුළු සංඛ්‍යාව		66951

8 සටහන

2009 වර්ෂයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් රාජ්‍ය අනුග්‍රහය ඇතිව පවත්වන ලබන තුන් අවුරුදු ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා උපාධි අපේක්ෂකයින් 590 දෙනෙකු කාණ්ඩ 04 ක් යටතේ ලියාපදිංචි වී ඇත.

ආයතනය, මෙම වර්ෂයේදී භූගෝල තාක්‍ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කරමින් සේවක දැනුම වර්ධනය කිරීමට සහාය වී ඇත. එමෙන්ම ආයතනය මිලියන 38 කට ආසන්න මුදලක් රාජ්‍ය ප්‍රතිපාදනවලට පරිබාහිරව බාහිර පාඨමාලා මගින් උපයා ඇත.

28. 09. 2012

ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම
අධ්‍යක්ෂ

මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

2009 දෙසැම්බර් 31 වනදයින් අවසන් වන මුදල් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2009	2009	2008	2008
වත්කම්					
ජංගම නොවන වත්කම්					
ඉඩම්, යන්ත්‍රාගාර සහ උපකරණ	1	24,108,486.95		14,437,205.94	
ආයෝජන	2	31,134,255.32		22,073,761.12	
			55,242,742.27		36,510,967.06
වර්තමාන ජංගම වත්කම	4				
භාණ්ඩ ලේඛන/තොග	4ඒ	831,279.01		500,095.83	
වෙළෙඳ සහ සෙසු ලැබීම්	4බී	4,615,281.15		4,776,578.43	
පෙර ගෙවීම්	4සී	17,043.98		17,943.75	
මුදල් සහ මුදල් සමතුල්‍යයන්	4ඩී	6,244,682.80		10,871,402.91	
			11,708,286.94		16,166,020.92
මුළු වත්කම්			66,951,029.21		52,676,987.98
වගකීම්					
භාවිත වගකීම්	5				
ගෙවීම්	5ඒ	5,811,068.12		4,019,103.00	
උපචිත ගෙවීම්	5බී	332,181.69		405,763.47	
			6,143,249.81		4,424,866.47
භාවිත නොවන ගෙවීම්	6				
ගෙවීම්	6ඒ	29,952,904.64		26,144,985.90	
විචල්‍ය ආදයම්	6බී	19,164,429.60		14,691,812.80	
පාරිතෝෂික විධිවිධාන	6සී	5,923,905.00		5,911,487.51	
			55,041,239.24		46,748,286.21
මුළු ගෙවීම්			61,184,489.05		51,143,152.68
මුළු ශුද්ධ වත්කම්			5,766,540.16		1,503,835.30
ශුද්ධ වත්කම්/සම වත්කම්	7				
වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන	7ඒ	269,273.56		448,290.63	
එකතු වූ අරමුදල්	7බී	5,488,562.81		1,043,724.27	
සංචිත-පරිත්‍යාග	7සී	8,703.80		11,820.40	
මුළු ශුද්ධ වත්කම්/සම වත්කම්			5,766,540.17		1,503,835.30

ඩී.එම්.එස්.එන්.කේ බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි

ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම
අධ්‍යක්ෂ

මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

2009 දෙසැම්බර් මස 31 වනදයින් අවසන් වූ වර්ෂය තුළ කාර්ය සාධනය සඳහා වූ මුදල් ප්‍රකාශය

	සටහන	2009	2008
මෙහෙයුම් ආදායම			
රජයේ ආධාර පුනරාවර්තන		16,806,000.00	16,380,000.00
ක්‍රමක්ෂය රජයේ ආධාර ක්ෂයවීම	6බී7බී	4,093,672.56	2,460,078.93
ආදායම-වෙනත් ආදායම	8ඒ	39,492,011.86	27,026,731.61
		60,391,684.42	45,866,810.54
මෙහෙයුම් වියදම්			
කාර්යමණ්ඩල වැටුප්	9ඒ	15,604,513.75	15,051,375.45
ගමනාගමන වියදම්	9බී	5,453.00	5,453.00
සැපයුම් සහ පරිභෝජන	9සී	1,771,873.91	1,353,191.68
නඩත්තු කාර්යයන්	9ඩී	855,850.84	403,841.48
ගිවිසුම් සේවා	9ඊ	1,993,038.84	1,848,675.61
සෙසු මෙහෙයුම් වියදම්	9එෆ්	1,223,902.97	1,245,649.19
පාරිතෝෂික	9ජී	490,022.50	
ක්ෂය වීම්	9එච්	4,093,672.56	2,460,078.93
ව්‍යාප්ත වැඩසටහන් පිළිබඳ වියදම්	9අයි	29,825,882.84	19,628,572.59
අපහරණය සහ පොතෙන් ලියා අස් කිරීම			9,055.55
මුළු මෙහෙයුම් වියදම්		55,883,249.21	42,005,893.48
ශුද්ධ අතිරික්තය/කාලපරිච්ඡේදය සඳහා (හිඟය)		4,508,435.21	3,860,917.06

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: සීර්/සී/අයිඑච්ආර්ඩී/09/වළ්
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2010 ජූනි 1 දින

අධ්‍යක්ෂ,

කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාර පනවන ලද 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය , විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උප වගන්ති සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් , යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA
දුරකථනය / தொலைபேசி / Telephone: 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail: oaggov@sltnet.lk

1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය , අදහස් දැක්වීම් සහ සොයාගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනය 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2009 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

විගණනය සඳහා 2010 මාර්තු 02 දින ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල පැවති ගිණුම්කරණ දෝෂ ඇතුළත් විගණන විමසුමක් 2010 මාර්තු 24 දින අධ්‍යක්ෂකවරයා වෙත යවන ලද අතර ඒ අනුව සංශෝධිත මූල්‍ය ප්‍රකාශ 2010 අප්‍රේල් 27 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලදි.

2.2.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛයක් ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් නිලධාරීන් 23 දෙනෙකුට 2009 වර්ෂයේ දී රු. 78,841 ක් ගෙවා තිබුණි.

2.2.2 හඳුනා නොගත් ශේෂ

2009 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් විවිධ අත්තිකාරම් ගිණුමෙහි රු. 197,829 ක්ද , උත්සව අත්තිකාරම් ගිණුමෙහි රු. 1,450ක්ද විශේෂ අත්තිකාරම් ගිණුමෙහි රු. 1,288ක ශේෂයක්ද විය.

2.2.3 වියදම් සඳහා වෙන් කිරීම්

ගෙවීම් සඳහා වෙන් කිරීම් යටතේ දක්වා ඇති එකතුව රු. 1,691,855 ක් වූ වැය විෂයයන් 20ක ශේෂයන් වසරකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 නීති ,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති ,රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2001 පෙබරවාරි 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ් /පීර් 14 vii ඡේදය	2009 වර්ෂය තුළ ආයතනය විසින් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් පවත්වාගෙන යනු ලබන ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව පිළිබඳව වැඩමුළුවක් රු. 170,290ක් වැය කරමින් සංචාරක හෝටලයකදී පවත්වා තිබුණි. එම වැඩමුළුව සඳහා අගෝස්තු 09 හා 10 දිනයන්හි ඊට සම්බන්ධ ආචාර්‍යවරුන් හා නිලධාරීන් 25ක් සහභාගි වන බව දක්වා තිබුණද ලිපිගොනු පරීක්ෂාවේදී වැඩිහිටියන් 49 ක් හා කුඩා ළමුන් ඊට සහභාගි වී තිබූ බව නිරීක්ෂණය විය.
(ආ) 2003 ජුනි 02 දින හා අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ) ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 හා 2006 මාර්තු 24 දිනැති චක්‍රලේඛය	2009 ඔක්තෝම්බර් 15 දින ඉදිරිපත් කළ 2009 වර්ෂය සඳහා වූ මිලදී ගැනීමේ සැලැස්ම චක්‍රලේඛ අනුව පිළියෙළ කර නොතිබුණි 2009 වර්ෂය සඳහා වන මිලදී ගැනීමේ සැලැස්මේ පිටපත් නියමිත දිනට පෙර භාණ්ඩාගාරය වෙත සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 756	සමාලෝචිත වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණය 2010 මාර්තු 25 දින වන විටත් සිදුකර නොතිබුණි.

3. මුල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

3.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 12,297,565 ක ඌනතාවයක් වූ අතර , ඉකුත් වර්ෂය සඳහා අනුරූප ඌනතාවය රු. 12,519,083 ක් විය. මේ අනුව සමාලොචිත වර්ෂයේ ඌනතාවය රු. 221,518කින් අඩු වී තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා රු. 16,806,000ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 4,508,435ක අතිරික්තයක් බවට පත් විය. ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 16,380,000 ක්වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 3,860,917 ක අතිරික්තයක් බවට පත් විය. රජයේ ප්‍රදානයන් හේතුවෙන් අතිරික්තය රු. 647,518 කින් වැඩි වී තිබුණි.

3.2 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රධාන උපාධි පාඨමාලාව වන ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා 2009 වර්ෂයේ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 590ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සිසුන් 108කින් අඩුවී තිබුණි.

(ii) 2009 වර්ෂයේ පවත්වන ලද උපාධි I වසර දෙවන සෙමෙස්තරය නව නිර්දේශය විභාගය පවත්වා මාස 07 ක් ගත වී තිබුණද ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි.

(ආ) 2009 වර්ෂය තුළ දී මුදල් අය කිරීමේ පාඨමාලා 14 ක් පවත්වා තිබුණ අතර ඒ සඳහා සහභාගි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 6,678කි. විභාගයන්ට පෙනී නොසිටි ශිෂ්‍ය සංඛ්‍යාව 499 ක් වූ අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 7% ක් විය. අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 300 ක් වූ අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 4% ක් විය. විභාගයන් 03 ක් පවත්වා මාස 04 සිට මාස 11 දක්වාකාලයක් ගත වී තිබුණද ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි.

(ඇ) මුදල් අය කිරීමේ පාඨමාලා ගාස්තු වශයෙන් රු.63,458,657 ක් 2009 වර්ෂය තුළ ලැබී තිබූ අතර එය ඉකුත් වර්ෂය හා සසඳන විට 28% ක වැඩිවීමක් විය.

(ඈ) ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා 2009 වර්ෂයේ දී වෙන් කරන ලද පැය ගණන පැය 690 ක් වූ අතර එය සෙමෙස්තර ක්‍රමය අනුව තීරණය විය. ඒ අනුව වෙන් කරන ලද පැය ගණනෙහි පෙර

වර්ෂයට වඩා දේශන පැය 630 ක අඩුවීමක් විය. එසේම 2009 වර්ෂය තුළදී පැවැත්වූ මුළු දේශන පැය ගණන පැය 449 ක් වූ අතර එය පෙර වර්ෂය හා සසඳන විට පැය 766.5 ක අඩුවීමක් විය. පවත්වන ලද දේශන පැය ගණනින් පැය 169 ක් ආයතනයේ අභ්‍යන්තර දේශකයින් දෙදෙනා විසින් ද පැය 280 ක් බාහිර දේශකයින් 13 දෙනෙකු විසින් ද පවත්වා තිබුණි. මේ අනුව පෙර වර්ෂය හා සසඳන විට අභ්‍යන්තර දේශකයින් විසින් පවත්වන ලද දේශන පැය 101ක අඩුවීමක් සහ බාහිර දේශකයින් විසින් පවත්වන ලද දේශන පැය 665.5ක අඩුවීමක්ද විය. මුළු දේශන පැය ගණනින් අභ්‍යන්තර දේශකයින් පවත්වා තිබුණු දේශන පැය ප්‍රමාණය 38% ක් විය.

(ඉ) 2007/2008 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් පැවැත් වූ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ ඩිප්ලෝමා පාඨමාලාව දෙවන සෙමෙස්තරය අවසන් වීමට නියමිත දිනට වඩා මාස 02ක්ද ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි I වසර දෙවන සෙමෙස්තරය අවසන් වීමට නියමිත දිනට වඩා මාස 05ක්ද ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි II වසර දෙවන සෙමෙස්තරය අවසන් වීමට නියමිත දිනට වඩා මාස 03ක්ද ප්‍රමාදව අවසන් කර තිබුණි.

3.3 සේවක මණ්ඩල තොරතුරු

සමාලෝචිත වර්ෂය අවසානයේදී ආයතනයේ අනුමත කාර්‍ය මණ්ඩලය 35ක් වූ අතර තත්‍ය කාර්‍ය මණ්ඩලය 50ක් විය. අනුමත කාර්‍ය මණ්ඩලයෙන් පරිබාහිර සම්බන්ධීකාරක තනතුරු 03ක් හා ව්‍යාපෘති සහායකයින් තනතුරු 12 දෙනෙකුගෙන් යුතුවිය.තවද අනුමත සේවක මණ්ඩලය තුළ නොමැති සම්බන්ධීකාරක තනතුරු සඳහා කාර්‍ය පැවරුම් පදනම මත /කොන්ත්‍රාත් පදනම මත ඉහත නිලධාරීන් බඳවා ගෙන ශාස්ත්‍රීය කමිටු අනුමැතිය මත ඔවුන්ගේ සේවා කාලය හා දීමනාවන් දිගින් දිගටම වැඩිකර තිබුණි.

3.4 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 ,5.1 ඡේදය අනුව ආයතනය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.
ආයතනය විසින් 2009 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. මේ නිසා 2009 වර්ෂයේදී ළඟා කර ගැනීමට /ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අභිමතාර්ථ හා ඉලක්ක මොනවාද යන වග හා එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇගයීමට ලක් කළ නොහැකි විය.

3.5 අයවැය පාලනය

2009 වර්ෂයේ අයවැය ලේඛනයෙහි ඇතුළත් ඇතැම් විෂයයන් සඳහා ඇස්තමේන්තු කළ ආදායම හා වියදම සමඟ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් තිබුණි. මේ අනුව

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

4 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂවරයා වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) බඳවා ගැනීම්
(ආ) අයවැය පාලනය
(ඇ) සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම්
(ඇ) දීමනා ගෙවීම්

එස්.ස්වර්ණජෝති
විගණකාධිපති

කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2012 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
2 මූල්‍ය ප්‍රකාශන			
2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම	විගණනය සඳහා 2010 මාර්තු 02 දින ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල පැවති ගිණුම්කරණ දෝෂ ඇතුළත් විගණන විමසුමක් 2010 මාර්තු 24 දින අධ්‍යක්ෂකවරයා වෙත යවන ලද අතර ඒ අනුව සංශෝධිත මූල්‍ය ප්‍රකාශ 2010 අප්‍රේල් 27 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලදි.		නිවැරදි කර ඇත.
2.2.1 මතභේදයට තුඩුදෙන කරුණු	1994 ජුනි 14 දින හා අංක 95 දරන ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛයක් ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් නිලධාරීන් 23 දෙනෙකුට 2009 වර්ෂයේ දී රු 78,841 ක් ගෙවා තිබුණි.	එකඟ වේ. භාෂා ප්‍රවීණතා දීමනාව විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව ගෙවන ලදි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කෙරේ.
2.2.2 හඳුනා නොගත් ශේෂ	2009 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් විවිධ අත්තිකාරම් ගිණුමෙහි රු. 197,829 ක්ද, උත්සව අත්තිකාරම් ගිණුමෙහි රු.1,450 ක්ද විශේෂ අත්තිකාරම් ගිණුමෙහි රු. 1,288ක ශේෂයක්ද විය.	එකඟ වේ. මෙම ශේෂ 2000 වර්ෂයටත් පෙර සිට අදාල තොරතුරු නොමැති වීම නිසා ගිණුම්වල ඉදිරියට ගෙනවිත් ඇත. මෙම ශේෂයන් වසර කිහිපයක් තිස්සේ හඳුනා නොගත් ශේෂ ලෙස විගණන වාර්තාවල ද සඳහන් වී ඇත. මෙම කරුණ ආයතනයේ විගණන කමිටුවේ දී සාකච්ජා කළ අතර ගිණුම්වලින් ලියා හැරීම සඳහා අදාල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීමට නිර්දේශ විය. ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවල උසස් අධ්‍යාපන අමාත්‍යංශය සහ මහා භාණ්ඩාගාරයෙන් නිර්දේශය ලබා ගැනීමට ආයතනයේ ශ්‍රාස්ත්‍රිය කමිටුවේ අනුමැතිය ලබාගන ඇත.	මෙම ශේෂයන් ලියා හැරීම සඳහා අනුමැතිය ලබාගැනීමට භාණ්ඩාගාරය වෙත දන්වා යවා ඇත. (ඇමුණුම 01)

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2012 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
2.2.3 වියදම් සඳහා වෙන් කිරීම්	ගෙවීම් සඳහා වෙන් කිරීම් යටතේ දක්වා ඇති එකතුව රු. 1,691,855 ක් වූ වැය විෂයයන් 20ක ශේෂයන් වසරකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වේ. මේ සඳහා අදාල සියලු ගැලපීම් නිසි පරිදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මෙය 2010/07/21 දින නිවැරදි කර ඇත. VN 32-1443 (ඇමුණුම 02)
2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවීම නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව (අ) 2001 පෙබරවාරි 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක/පීඑෆ්/පීප් 14 vii ජේදය	නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ. අනුකූල නොවීම 2009 වර්ෂය තුළ ආයතනය විසින් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් පවත්වාගෙන යනු ලබන ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව පිළිබඳව වැඩමුළුවක් රු.170,290 ක් වැය කරමින් සංචාරක හෝටලයකදී පවත්වා තිබුණි. එම වැඩමුළුව සඳහා අගෝස්තු 09 හා 10 දිනයන්හි ඊට සම්බන්ධ ආචාර්යවරුන් හා නිලධාරීන් 25 ක් සහභාගි වන බව දක්වා තිබුණද ලිපිගොනු පරීක්ෂාවේදී වැඩිහිටියන් 49 ක් හා කුඩා ළමුන් ඊට සහභාගී වී තිබූ බව නිරීක්ෂණය විය.	එකඟ නොවේ. ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත පවත්වාගෙන යන බව සත්‍යයකි. නමුත් විගණන වාර්තාවේ සඳහන් වන පරිදි පවත්වා තිබූ වැඩමුළුව එහි ආරම්භක වැඩමුළුව නොවන අතර ඒ සඳහා මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතා කර තිබුණේ ද නැත. මෙම පාඨමාලාව පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය බාහිර කථිකාචාර්යවරුන් හා අභ්‍යන්තර දේශකවරුන් උදෙසා අදාල වැඩමුළුව පැවැත්වූ අතර ඒ සඳහා එම වසරේ අදාල අයදුම්පත් නිකුත් කිරීමේදී තවමත් ශිෂ්‍යයන් නොවන බාහිර අයදුම්කරුවන්ගෙන් අයකරනු ලැබූ මුදල් වලින් ඉතිරි වූ කොටසක් භාවිතයට ගන්නා ලදි. අදාල වැඩමුළුව පැවැත්වීමටත්, ඒ සඳහා වූ අයවැය වාර්තාවටත් ආයතනයේ ශාස්ත්‍රිය කමිටුවේ අනුමැතිය නිසි පරිදි ලබාගෙන ඇත. මෙම ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ 90 ක් පමණ වන බාහිර කථිකාචාර්යවරු හා නිලධාරීන්ට අමතරව මෙම වැඩමුළුවේ රාජකාරී කටයුතු කිරීම සඳහා විෂයන්ට අදාල කාර්යය මණ්ඩලයේ කිහිප දෙනෙකුටද ශාස්ත්‍රිය කමිටුවේ සාමාජිකයන් කිහිප දෙනෙක්ද, එම පාඨමාලා අභ්‍යන්තර දේශකවරුන්ද මෙම වැඩමුළුවට සහභාගිවීම අනිවාර්ය විය. අත්‍යවශ්‍ය දේශකවරු කිහිපදෙනෙක් සති අන්ත දිනයන් බැවින් තම ළමයින් නවතා ඒමට නොහැකි බව ප්‍රකාශ කළ බැවින් ඒ සඳහා ඉඩ ලබා දුනි. ආයතනයේ සහ පාඨමාලාවල දියුණුව සඳහා මෙවැනි වැඩමුළු අත්‍යාවශ්‍යය. 90 පමණ වන බාහිර කතිකාචාර්යවරුනට අදාල වැඩමුළුව පැවැත්වීමට ආයතනය සතුව සුදුසු ස්ථානයක් නොමැත.	මේ සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වියදම් කර නැත. වියදම් කර ඇත්තේ උපයාගත් මුදල් වේ. කලට වේලාවට ප්‍රතිඵල නිකුත් කිරීමට බාහිර කථිකාචාර්යවරු ධෛර්යමත් කිරීමේ එක් පියවරක් පමණි. එයින් ආචාර්යවරු ධෛර්යමත් වී ඇත.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2012 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
(ආ) 2003 ජුනි 02 දින හා අංක/පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	එකඟ වේ. ආයතනයේ ස්ථිර පරිපාලන ලේඛකාධිකාරීවරයෙක් 2009 වසර අවසානයේ නොසිටි නිසා වාර්ෂික වාර්තාව සැකසීම ප්‍රමාද විය. මේ වන විට 2009 වාර්ෂික වාර්තාව සකස් කරමින් පවති.	කෙටුම්පත සකස් කර පරිවර්තනයට යවා ඇත.
(ඇ) ජාතික අයවැය චක්‍රලේඛය අංක 128 හා 2006 මාර්තු 24 දිනැති චක්‍රලේඛය	2009 ඔක්තෝම්බර් 15 දින ඉදිරිපත් කළ 2009 වර්ෂය සඳහා වූ මිලදී ගැනීමේ සැලැස්ම චක්‍රලේඛ අනුව පිළියෙළ කර නොතිබුණි. 2009 වර්ෂය සඳහා වන මිලදී ගැනීමේ සැලැස්මේ පිටපතක් නියමිත දිනට පෙර භාණ්ඩාගාරය වෙත සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා නොතිබුණි.	එකඟ වේ. මෙම කාර්යය සිදුකරන පරිපාලන නිලධාරීන් කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවති තනතුරු සඳහා අදාල කාලයේ දී අලුතින් පත්වීම් ලැබ පැමිණි අය වන අතර ඔවුන්ගේ රාජකාරීවල බහුලත්වය නිසා මෙම කටයුත්ත අතපසු වී ඇත. කෙසේ වුවද 2010 වසර සඳහා වන මිලදී ගැනීමේ සැලැස්ම නිසි පරිදි සකස් කර අදාල අංශ වෙත යොමු කර ඇත.	2010 මිලදී ගැනීමේ සැලැස්ම (ඇමුණුම 03)
(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 756	සමාලෝචිත වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණය 2010 මාර්තු 25 දින වන විටත් සිදුකර නොතිබුණි.	(ඈ) එකඟ නොවේ. භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි පරිදි අවසන් කර ඇති අතර එම වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කරන ලදි.	ඉටු කර ඇත.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2012 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
3 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය			
3.1 මූල්‍ය ප්‍රතිඵල	ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.12,297,565 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූප ඌනතාවය රු.12,519,083 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.221,518 කින් අඩු වී තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා රු. 16,806,000 ක්වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය 4,058,435 ක අතිරික්තයක් බවට පත් විය. ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.16,380,000 ක්වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂය සඳහා වූ ඌණතාවය රු.3,860,917 ක අතිරික්තයක් බවට පත් විය. රජයේ ප්‍රදානයන් හේතුවෙන් අතිරික්තය රු.647,518 කින් වැඩි වී තිබුණි.	එකඟ වේ	අතිරික්තය වනාහි ඉදිරි වසරේ ගෙවන පාඨමාලා වල වියදම් සඳහා අයවැය වාර්තා මගින් අනුමත කර ඇති මුදල් වේ. පාඨමාලා අයවැය වාර්තා අනුව මුදල් වියදම් කෙරේ.
3.2 කාර්යසාධනය අ i	පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රධාන උපාධි පාඨමාලාව වන ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව සඳහා 2009 වර්ෂයේ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 590 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සිසුන් 108 කින් අඩු වී තිබුණි.	එකඟ වේ මීට ඉහත වර්ෂවලදී දේශන පැවැත්වූ ශාලා, අධි ආරක්ෂිත කලාපයේ පිහිටීම හේතුවෙන් 2009 වර්ෂයේ සිට එම ශාලා ලබාගැනීමට නොහැකිවිය. එබැවින් එවැනි ඉඩ ප්‍රමාණයක් ඇති දේශන ශාලා ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් 2009 වර්ෂයේ සිසුන් අඩු ප්‍රමාණයක් ලියාපදිංචි කර ගැනීමට සිදුවිය. පවත්වන ලද විභාගවල ප්‍රතිඵල පරීක්ෂා කිරීමට බාහිර කතිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට සිදු වී ඇති අතර මේ වන විට සියලු ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කරමින් සිටි.	ප්‍රතිඵල නිකුත් කර උපාධි ප්‍රදානෝත්සවද පවත්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2012 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
කාර්යසාධනය අ ii	2009 වර්ෂයේ පවත්වන ලද උපාධි I වසර සෙමෙස්තරය නව නිර්දේශය විභාග පවත්වා මාස 07 ක් ගත වී තිබුණද ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි.	එකඟ නොවේ. එම අධ්‍යයන වර්ෂයට අදාල උපාධි III වසර දේශන පැරණි නිර්දේශය යටතේ පැවති බැවින් 2008 වර්ෂයේ විභාග පවත්වා අවසන් කරන ලදී. එම නිසා 2009 වසරේ පැවැත්වීමට විභාග නොතිබුණි.	නිකුත් කර ඇත.
කාර්යසාධනය ආ	2009 වර්ෂය තුළදී මුදල් අය කිරීමේ පාඨමාලා 14 ක් පවත්වා තිබුණ අතර ඒ සඳහා සහභාගි වු එම ශිෂ්‍ය සංඛ්‍යාව 6,678කි. විභාගයන්ට පෙනී නොසිටි ශිෂ්‍ය සංඛ්‍යාව 499 ක්වූ අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 7% ක් විය. අසමත් වු ශිෂ්‍ය සංඛ්‍යාව 300 ක් වු අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 4% ක් විය. විභාගයන් 03 ක් පවත්වා මාස 04 සිට මාස 11 දක්වා කාලයක් ගතවී තිබුණද ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි.	එකඟ වේ ආයතනය මගින් මෙහෙයවනු ලබන මුදල් අය කිරීමේ පාඨමාලාවන් දේශන හා පිළිතුරු පත් ඇගයීමේ කටයුතු බාහිර දේශක මහත්ම මහත්මීන් විසින් සිදුකරනු ලබයි. මෙහිදී පිළිතුරු පත් ඇගයීම් ලකුණු නිසි වේලාවට නොලැබීම හේතුවෙන් පාඨමාලා 14 කින් පාඨමාලා 3 ක පමණක් විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට නොහැකි විය. කෙසේ වුවද එම ප්‍රතිඵල ද හැකි තරම් ඉක්මණින් නිකුත් කිරීමට කටයුතු කරමින් සිටී.	ප්‍රතිඵල නිකුත් කර ඇත.
කාර්යසාධනය ඇ	මුදල් අය කිරීමේ පාඨමාලා ගාස්තු වශයෙන් රු.63,458,657 ක් 2009 වර්ෂය තුළ ලැබී තිබු අතර එය ඉකුත් වර්ෂය හා සසඳන විට 28% ක වැඩිවීමක් විය.	එකඟ වේ	මෙයට ඉදිරි වර්ෂය සඳහා පාඨමාලා සඳහා ගෙවන ලද ගාස්තු ද අය වැය ලේඛන අනුව වියදම් කිරීමට තිබු අතර දැන් අය වැය පියවා ඇත.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2012 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
කාර්යසාධනය ඇ	ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව සඳහා 2009 වර්ෂයේදි වෙන් කරන ලද පැය ගණන පැය 690 ක් වු අතර එය සෙමෙස්තර ක්‍රමය අනුව තිරණය විය. ඒ අනුව වෙන් කරන ලද පැය ගණනෙහි පෙර වර්ෂයට වඩා දේශන පැය 630ක අඩුවීමක් විය. එසේම 2009 වර්ෂය තුළදි පැවැත්වු මුළු දේශන පැය ගණන පැය 449 ක් වු අතර එය පෙර වර්ෂය හා සසදන විට පැය 766.5 ක අඩුවීමක් විය. පවත්වන ලද දේශන පැය ගණනින් පැය 169 ක් ආයතනයේ අභ්‍යන්තර දේශකයින් දෙදෙනා විසින් ද පැය 280 ක් බාහිර දේශකයින් 13 දෙනෙකු විසින් ද පවත්වා තිබුණි. මේ අනුව පෙර වර්ෂය හා සසදන විට අභ්‍යන්තර දේශකයින් විසින් පවත්වන ලද දේශන පැය 101 ක අඩුවීමක් සහ බාහිර දේශකයින් විසින් පවත්වන ලද දේශන පැය 665.5ක අඩුවීමක්ද විය. මුළු දේශන පැය ගණනින් අභ්‍යන්තර දේශකයින් පවත්වා තිබුණු දේශන පැය ප්‍රමාණය 38% විය.	එකඟ වේ 2009 වසරට කලින් වසරවලදී ඉංග්‍රීසි මාධ්‍යය පාඨමාලාව ද පවත්වන ලදී. 2009 වර්ෂයේ ඉංග්‍රීසි පාඨමාලා දේශන නොපැවති බැවින් සහ උපාධි 111 වසර පාඨමාවේ දේශන 2009 සැප්තැම්බර් මස අගභාගයේදී ආරම්භවීම හේතුවෙන් දේශන පැය ගණන අඩු වී ඇත.	සුපුරුදු පරිදි දේශන පැවැත්වේ.
කාර්යසාධනය ඉ	2007/2008 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් පැවැත් වු ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාවේ ඩිප්ලෝමා පාඨමාලාව දෙවන සෙමෙස්තරය අවසන් වීමට නියමිත දිනට වඩා මාස 02ක්ද ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි I වසර දෙවන සෙමෙස්තරය අවසන් වීමට නියමිත දිනට වඩා මාස 05 ක්ද ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි II වසර දෙවන සෙමෙස්තරය අවසන් වීමට නියමිත දිනට වඩා මාස 03 ක්ද ප්‍රමාදව අවසන් කර තිබුණි.	එකඟ වේ 2009 වසරට කලින් වසරවලදී ඉංග්‍රීසි මාධ්‍යය පාඨමාලාව ද පවත්වන ලදී. 2009 වර්ෂයේ ඉංග්‍රීසි පාඨමාලා දේශන නොපැවති බැවින් සහ උපාධි 111 වසර පාඨමාවේ දේශන 2009 සැප්තැම්බර් මස අගභාගයේදී ආරම්භවීම හේතුවෙන් දේශන පැය ගණන අඩු වී ඇත. ආයතනයේ අභ්‍යන්තර දේශකවරු දෙදෙනාට අමතරව සිටි අනෙකුත් සියලු දේශකවරු බාහිර දේශකවරු විය. ඔවුන් කිහිප දෙනෙකුට අත්‍යවශ්‍ය කරුණු කිපයක් මත දේශන නියමිත දිනට පැවැත්වීමට නොහැකි වු නිසා මෙම තත්වය ඇති විය. මේ වනවිට මෙම තත්වය වලක්වා ගැනීමට කටයුතු කර ඇත.	බාහිර දේශකවරුන්ට දිනපතා SMS මගින් මතක් කෙරේ. සියලුම කාර්යාලවල සිට එන සිසුන්ටද දේශන වෙනස් වීම් පිළිබඳව SMS මගින් දැනුම් දේ.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2012 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
3.3 සේවක මණ්ඩල තොරතුරු	සමාලෝචිත වර්ෂය අවසානයේදී ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 35 ක් වු අතර තත්‍ය කාර්ය මණ්ඩලය 50 ක් විය. අනුමත කාර්ය මණ්ඩලයෙන් පරිබාහිර සම්බන්ධීකාරක තනතුරු 03 ක් හා ව්‍යාපෘති සහායකයින් තනතුරු 12 දෙනෙතුගෙන් යුතුවිය. තවද අනුමත සේවක මණ්ඩලය තුළ නොමැති සම්බන්ධීකාරක තනතුරු සඳහා කාර්ය පැවරුම් පදනම මත / කොන්ත්‍රාත් පදනම මත ඉහත නිලධාරීන් බඳවා ගෙන ශාස්ත්‍රීය කමිටු අනුමැතිය මත ඔවුන්ගේ සේවා කාලය හා දීමනාවන් දිගින් දිගටම වැඩිකර තිබුණි.	එකඟ නොවේ. අතිරේක කාර්ය මණ්ඩලයක් ආයතනයේ නොමැත. අනුමත කාර්ය මණ්ඩලයේ 35 දෙනාට අමතරව සිටිනුයේ අතිරේක කාර්ය මණ්ඩලයක් නොව ව්‍යාපෘති යටතේ වු 15 දෙනෙකි. අමතරව සිටිනුයේ පැවරුම් පදනම මත ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන අතිරේක ව්‍යාපෘති යටතේ වු කෙටිකාලීන පාඨමාලාවන්ගේ වැඩකටයුතු සඳහා බඳවා ගත් සම්බන්ධීකාරකවරු තිදෙනෙක් හා ව්‍යාපෘති සහායකයින් 12 දෙනෙකු වන අතර ඔවුන් ආයතනයේ අතිරේක කාර්ය මණ්ඩලය නොවේ. මෙම ව්‍යාපෘති පැවරුම්ලාභින් වෙනුවෙන් ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන නොලැබෙන අතර අදාල පාඨමාලවන්ගේ ඉපැයීම් වලින් ශාස්ත්‍රීය කමිටු අනුමැතිය ලැබූ වැය ශීර්ෂ මත කරනු ලබයි. මෙම පාඨමාලාවන්ට බඳවා ගත් පැවරුම්ලාභින් බඳවා ගැනිමේදී ආරම්භක දීමනාවන් අදාල පාඨමාලාවල වර්ධනය, ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම, වැඩකටයුතු හා රාජකාරී වැඩිවීම සහ ජීවන වියදම වැඩිවීම සැලකිල්ලට ගෙන අදාල පාඨමාලා කමිටුවේ නිර්දේශ සහ ශාස්ත්‍රීය කමිටුවේ අනුමැතිය මත වැඩිකර ඇත.	උපයන මුදල් මගින් කෙරෙන රැකියා නිෂ්පාදනයකි.
3.4 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම	2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පිඊඩී/12,5.1 ඡේදය අනුව ආයතනය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. ආයතනය විසින් 2009 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. මේ නිසා 2009 වර්ෂයේදී ළඟා කර ගැනීමට / ඉටුකර ගැනීමට බලාපොරොත්තු වු අභිමතාර්ථ හා ඉලක්ක මොනවාද යන වග හා මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇගයීමට ලක් කළ නොහැකි විය.	එකඟ වේ. 2008 වසරේ මාස 09ක කාලයක් ආයතනයේ ස්ථිර පරිපාලන ලේඛකාධිකාරීවරයෙකු සහ මුල්‍යාධිකාරීවරයෙකු නොසිටි නිසා සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම ප්‍රමාද විය. නව නිලධාරීන් පත් වි පැමිණි පසු මෙම කටයුත්ත ආරම්භ කලද නැවත වාරයක් එම නිලධාරීන් දෙදෙනා ආයතනයෙන් ඉවත්ව ගිය නිසා එම කටයුතු අඩපන විය. නැවත අදාල තනතුරු සඳහා නව නිලධාරීන් දෙදෙනෙකු පත් වි පැමින සිටින අතර ඔවුන් විසින් හැකිතාක් ඉක්මණින් අදාල සැලසුම් සකස් කිරිමට කටයුතු කරමින් සිටි.	අදාල නිලධාරීන් ලැබී ඇත. සැලසුම් සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2012 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
3.5 අයවැය පාලනය	2009 වර්ෂයේ අයවැය ලේඛනයෙහි ඇතුළත් ඇතැම් විෂයයන් සඳහා ඇස්තමේන්තු කළ ආදායම හා වියදම සමඟ තථ්‍ය ආදායම අතර සැලකිය යුතු විචලනයන් තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.	එකඟ නොවේ. ඇස්තමේන්තු වියදම සහ තත්‍ය වියදම අතර විචලනයට පහත සඳහන් බාහිර කරුණු කිහිපයක් බලපාන ලදි. (i) 2009 වසරේ පරිපාලන හා මූල්‍ය නිලධාරින් පත්කිරීම ප්‍රමාද වූ හෙයින් අපේක්ෂිත පරිදි සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. (ii) ලිපිකාර හා සමාන්තර ශ්‍රේණියේ සේවකයන් බඳවා ගැනීම සඳහා සීමාවන් (භාණ්ඩාගාර) පැවති නිසා අපේක්ෂිත බඳවා ගැනීම් කටයුතු කල නොහැකි විය. (iii) අනපේක්ෂිත මිල වැඩිවීම් හේතු කොටගෙන සමහර වියදම් අයවැය සීමාවන් තුළ පවත්වාගෙන යාම අපහසු විය. උදා : මුද්‍රණ යන්ත්‍ර තීන්ත කඩදාසි, ආදිය	2011 වසරේ නිවැරදිව කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදි
4 පද්ධති හා පාලන	විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂකවරයා වෙත වරින් වර දන්වන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය. (අ) බඳවා ගැනීම්	නිසි පරිදි බඳවා ගැනීම් කිරීමට කටයුතු කර ඇත.	ඉදිරියේදී නිසි පරිදි කටයුතු කෙරේ.
	(ආ) අයවැය පාලනය		ඉහතින් දක්වා ඇත
	(ඇ) සම්මන්ත්‍රණ හා වැඩමළු පැවැත්වීම්	ආයතනය විසින් පැවත්වූ සියළු සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා නිසි අනුමැතිය ලබාගෙන පවත්වා ඇත. මහාභාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන භාවිතා කර කිසිඳු පාඨමාලාවක ආරම්භක වැඩමුළුවක් කිසිඳු පෞද්ගලික හෝටලයක පවත්වා නැත.	උපයාගත් මුදලින් අනුමත අයවැය අනුව පැවැත්වේ.
	(ඈ) දීමනා ගෙවීම්	සියලූ දීමනා හා ගෙවීම් නිසි පරිදි ලබාගත් අනුමැතියන්ට අනුව සිදුකර ඇත.	අනුමත අයවැය අනුව උපයාගත් මුදලින් කෙරේ.